තොරතුරු මාසිකය

# විමර්ශන

2024 ජනවාරි
ජනතා විමුක්ති පෙරමුණේ
අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.

ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!

# ගෝලීය නිෂ්පාදනය සහ වෙළෙඳාම

**ධනවාදය ලෝකය පුරා අසාර්ථක වෙමින් පවතී. ඒ අනුව ලෝකය පුරා සාතිශය බහුතර රටවල් ප්‍රමාණයකට මුහුණ දීමට සිදුව ඇත්තේ සාගත, යුද්ධ, වසංගත , සුරාකෑම , අසමානතාව, දුප්පත්කම වැනි කාරණාවලටය. එයට විශාල ලෙස මුහුණ දීමට සිදුව ඇත්තේ ධනේශ්වර නිර්ණායකයන්ට අනුව සංවර්ධනය වෙමින් පවතින සහ ඌණ සංවර්ධිත රටවලටය. ලෝක නිෂ්පාදනය සහ වෙළෙඳපොළ රටවල් කිහිපයක් අතර කේන්ද්‍රගත වීම මඟින් ලෝකයේ සම්පත් බෙදීයාමේ විෂමතාව මනා ලෙස පිළිබිඹු වේ. එය පහත අංක 01 වගුවෙන් දැක්විය හැකිය.**

| ලෝක නිෂ්පාදනය බෙදී ගොස් ඇති ආකාරය - 2022 | | |
|---|---|---|
| ස්ථානය | රට | දළ දේශීය නිෂ්පාදනය USD Billion |
| | මුළු ලෝක නිෂ්පාදනය | 100,562 |
| 01 | එක්සත් ජනපදය | 25,462 |
| 02 | චීනය | 17,963 |
| 03 | ජර්මනිය | 4,072 |
| 04 | ජපානය | 4,231 |
| 05 | ඉන්දියාව | 3,385 |
| | රටවල් පහක එකතුව | 55,113 |
| 87 | ලංකාව | 74 |
| මූලාශ්‍රය : Wikipedia.org (වගු අංක 01) | | |

ඉහත දත්තවලට අනුව ලෝක බැංකුවේ වර්ගීකරණයන් යටතේ ලෝකයේ රටවල් 213ක දළ දේශීය නිෂ්පාදනය ට්‍රිලියන 100ක් වන විට එයින් 55%ක් හිමිව ඇත්තේ රටවල් පහකටය. ඒ අනුව ලෝකයේ වෙළෙඳ දිසාව තීරණය වීම සහ ගෝලීය බල දේශපාලනය ක්‍රියාත්මක වීම පිළිබඳ අදහසක් මෙහි ගැබ්ව ඇත. ඩොලර් බිලියන 74කට හිමිකම් කියන ලංකාවේ පංගුව 0.074%ක් පමණ වන අතර, එය චීනයට, ඉන්දියාවට සාපේක්ෂව කෙතරම් කුඩා ආර්ථිකයක්ද යන්න මෙයින් පැහැදිලි වේ. එලෙසම ජර්මනියට, ජපානයට සහ ඉන්දියාවට චීනය පසුකර යාමට තවත් දශක කිහිපයක්වත් ගතවන අතර, චීනයට ඇමෙරිකා එක්සත් ජනපදය පසුකර යාමට තවත් වසර ගණනාවක් යනු ඇත. අනෙක් අතට ලෝකයේ රටවල් කොපමණ ප්‍රමාණයක් දුප්පත්කමට පත්වී ඇත්ද යන්නත්, ගෝලීය ප්‍රාග්ධනයේ හැසිරීම පිළිබඳවත් මෙහිදී අදහසක් ඇති වේ.

එහෙත්, දළ දේශීය නිෂ්පාදනය ජනගහනය අතර බෙදී යන ආකාරය අනුව ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදනය (මෙය ඒකපුද්ගල ආදායම ලෙසද හඳුන්වනු ලබයි.) ගණනය කරනු ලබන අතර ඒ මත රටවල දුප්පත්, පොහොසත්භාවය තීරණය කෙරේ. පහත 02 වගුවෙන් දැක්වෙන්නේ ලෝකයේ පොහොසත්ම රටවල් කිහිපයක් සහ දුප්පත්ම රටවල් කිහිපයකි.

| ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදනය ඒකපුද්ගල ආදායම 2022 | | |
|---|---|---|
| ස්ථානය | රට | USD Billion |
| 01 | ලක්සම්බර්ග් | 126,426 |
| 02 | අයර්ලන්තය | 104,039 |
| 03 | නෝර්වේ | 106,149 |
| 04 | ස්විට්සර්ලන්තය | 92,102 |
| 05 | සිංගප්පූරුව | 82,808 |
| 07 | එක්සත් ජනපදය | 76,398 |
| 64 | චීනය | 12,720 |
| 132 | ලංකාව | 3,354 |
| 143 | ඉන්දියාව | 2,389 |
| 193 | දකුණු සුඩානය | 400 |
| 194 | ඇෆ්ගනිස්ථානය | 364 |
| 195 | බුරුන්ඩි | 238 |
| මූලාශ්‍රය : Wikipedia.org (වගු අංක 02) | | |

ධනේශ්වර නිර්ණායක වලට අනුව ඉහත මුල් රාජ්‍යයන් පහම ලෝකයේ දියුණුම සංවර්ධිත රටවල් බවට පත්වී ඇත්තේ, ඉහළ ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදනයක් අත්පත් කර ගැනීමෙනි. එහි අනෙක් අර්ථය වන්නේ අඩු ජනගහනයකින් ප්‍රාග්ධනය කොපමණ ප්‍රමාණයක් නිෂ්පාදනය කර තිබේද යන්නයි. මෙයට ප්‍රධානම ලෙස තාක්ෂණයේ දියුණුව සහ සුරාකෑම බලපා ඇත. අනෙක් අතට ලෝකයේ දුප්පත්ම රටවල මිනිසුන්ගේ ඒකපුද්ගල ආදායම දිනකට ඩොලරයකටත් වඩා අඩුවීමෙන් පෙන්නුම් කරන්නේ ලෝකයේ ආදායම් විෂමතාව කෙතරම් පුළුල්වී ඇත්ද යන්නයි. ඒ අතර වාර්ෂික ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදනය ඩොලර් 1,000ට අඩු රටවල් 25ක් පමණ ලෝකයේ ඇති අතර 2,000ට අඩු රටවල් 45ක් පමණ ඇත.

ලෝකයේ නිෂ්පාදනය සහ එය බෙදීයාම එලෙස පැවැතියද, තවමත් ලෝකයේ වෙළෙඳ ආධිපත්‍යය හිමි කරගෙන සිටින්නේ චීනයයි. පහත සටහනින් දැක්වෙන්නේ ලෝකයේ භාණ්ඩ හා සේවා අපනයනය කරන ප්‍රධාන රටවල් කිහිපයකි. (වගු අංක 03)

| භාණ්ඩ හා සේවා අපනයනය - 2022 | | |
|---|---|---|
| ස්ථානය | රට | USD Billion |
| 01 | චීනය | 3,715 |
| 02 | එක්සත් ජනපදය | 3,011 |
| 03 | ජර්මනිය | 2,060 |
| 04 | ප්‍රංශය | 1,005 |
| 05 | එක්සත් රාජධානිය | 1,001 |
| 10 | ඉන්දියාව | 767 |
| 98 | ලංකාව | 13 |
| (වගු අංක 03) | | |

ඉහත වගුවට අනුව 2022 වසරේ ලෝකයේ අපනයන වෙළෙඳාම එක්සත් ජනපද ඩොලර් බිලියන 25,000ක් පමණවී ඇති අතර, එම වෙළෙඳ පංගුවෙන් 27%ක් පමණ බෙදී ගොස් ඇත්තේ,

06 පිටුවට

# විගණකාධිපති ඇසට හසු වූ මහා පරිමාණ මුදල් මංකොල්ලයන්




**2022 අප්‍රේල් මාසයේ සිට ණය ගෙවීමට කටයුතු නොකරන බව ප්‍රකාශයට පත් කිරීමත් සමඟ ශ්‍රී ලංකාව බංකොලොත් රාජ්‍යයක් ලෙස නාමකරණය විය. මේ බංකොලොත්භාවයේ ප්‍රතිඵලය පිටුපස මහජන මුදල් භාවිතයේදී සිදු වූ මහා පරිමාණ දූෂණ, වංචා ඇති බවට විවිධ සාක්ෂි පසුගිය කාලය පුරාවටම සාකච්ඡාවට බඳුන් වී තිබිණි. විගණකාධිපතිවරයා විසින් 2023 ඔක්තෝබර් 23 දින එළිදක්වන ලද විගණකාධිපති වාර්ෂික වාර්තාව - 2022 විසින්ද නැවත වරක් තහවුරු කර ඇති මහජන මුදල් අවභාවිතයන් පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වනු ඇත්තේ ඒවා රාජ්‍ය යාන්ත්‍රණය විසින්ම අනාවරණය කරනු ලබන දත්ත නිසාය.**

### කාබනික පොහොර උමතුව ගෙනා පාඩුව

ජාතික ශාක නිරෝධායන පර්යේෂණාගාරය වෙත ඉදිරිපත් කරන ලද නියැදි පරීක්ෂණවලින් අසමත්වූ කාබනික පොහොර ආනයනය කිරීම නිසා රටට සිදුවී තිබූ අලාභය - රු. මිලියන 1,383 (ඩො.මි. 6.9)කි.

කාබනික පොහොර ආනයනය කිරීමේදී 1999 අංක 35 දරන ආරක්ෂණ පනතට අනුව ශාක නිරෝධායන සහතිකය සහ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද ආනයන බලපත්‍රය ලබා ගත යුතු වේ. නමුත්, එවැනි අනුමැතියක් ලබා නොදී තිබියදී සහ ජාතික ශාක නිරෝධායන නියැදි පරීක්ෂණ අසමත් බව දැන දැනම 2021/2022 මහ කන්නයේ හෙක්ටයාර ලක්ෂ 05කට අවශ්‍ය කාබනික පොහොර මෙ.ටො. 96,000ක් චීනයේ සමාගමකින් ආනයනය කර එම පොහොර රටට ගොඩබෑමකින් තොරව ඇ.ඩො. මිලියන 6.9කට සමාන රු. මිලියන 1,383ක් අනාර්ථිකව අදාළ සමාගම වෙත ගෙවීමට සිදුවී තිබිණි. - විගණකාධිපති වාර්ෂික වාර්තාව - 2022 (පිටුව 73)

### විදුලි බලාගාර අත්පත් කර නොගැනීම නිසා සිදු වූ පාඩුව

'ඒස් පවර් ඇඹිලිපිටිය' (පෞද්ගලික) සමාගම සමඟ ඇති කර ගත් ගිවිසුමෙහි වලංගු කාලයවූ වසර 10ක කාලය 2005 අප්‍රේල් 06 සිට 2015 අප්‍රේල් 06 වන දිනෙන් අවසන්වූ පසු මෙම බලාගාරය ලංකා විදුලිබල මණ්ඩලය මඟින් මිලදී ගැනීම සඳහා සලකා බැලීමට 2016 මාර්තු 23 දින රැස්වූ අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබිණි. රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් සමාගම රු.මි. 2,370කට තක්සේරු කර තිබූ අතර, බලාගාරයේ හිමිකරුවන් විසින් එය රු.මි. 2,446ක ලංසුවකට මණ්ඩලයට අලෙවි කිරීමට එකඟවී තිබිණි. වසර 10ක මුල් ගිවිසුම් කාලය තුළදී ගිණුම්ගත කරන ලද ශුද්ධ ලාභයේ සාමාන්‍යය ඉදිරි වසර 8ක් සඳහා සියයට 9.5ක වට්ටම් සාධකය යටතේ වට්ටම් කිරීමෙන් බලාගාරයේ වටිනාකම රු.මි. 4,192කට ආසන්න අගයක් විය. කෙසේ වෙතත්, මෙම බලාගාරය මිලදී ගැනීමට කටයුතු කිරීමකින් තොරව 2016 අප්‍රේල් 6 දින සිට 2022 සැප්තැම්බර් 8 දින දක්වා අවස්ථා 4කදී වසර 05යි, මාස 06ක කාලයක් සඳහා මූලික ගිවිසුම දීර්ඝ කිරීමට කටයුතු කර තිබිණි. ඒ අනුව බලාගාරය මණ්ඩලයට අත්කරගෙන රජයට වඩා වාසිදායක ලෙස පවත්වාගෙන යාමට තිබූ අවස්ථාව අහිමි වී තිබිණි. - විගණකාධිපති වාර්ෂික වාර්තාව - 2022 (පිටුව 323)

### තවමත් ඉදිරියට යන හෙජින් පාඩුව

ඉදිරි සුරැකුම් ගනුදෙනු (හෙජින්) නිසා සිදු වී ඇති පාඩුව 2022.12.31 දිනට - රු.මි. 14,028කි.

2007 සිට 2009 දක්වා කාලය තුළ සංස්ථාව විසින් තෙල් මිලදී ගැනීම සම්බන්ධයෙන් සිදු කර තිබූ ඉදිරි සුරැකුම් ගනුදෙනු (හෙජින්) ගනුදෙනුවලට අදාළව සිදු කරන ලද විගණන පරීක්ෂණයට අනුව එම ගනුදෙනුවලින් 2022 දෙසැම්බර් 31 දිනට රටට සිදුවූ මුළු පාඩුව රු.මි. 14,028ක් වී තිබිණි. තවද, සංස්ථාවට එරෙහිව එ.ජ.ඩො. මිලියන 8.6ක අයිතියක් සඳහා කොමර්ෂල් බැංකුව විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ නඩුවක් පවරා තිබෙන අතර, එම නඩුව 2022 වර්ෂය අවසානය වන විටත් විභාග වෙමින් පැවැතිණි. - විගණකාධිපති වාර්ෂික වාර්තාව - 2022 (පිටුව 325)

### ව්‍යාපෘති අත්හැර දැමීමේ පාඩුව

ව්‍යාපෘති 09ක් අත්හැර දැමීම නිසා සිදුවී ඇති පාඩුව 2022.12.31 දිනට - රු.මි. 203,159කි.

ගිං, නිල්වලා හැරවීමේ ව්‍යාපෘතිය, උමා ඔය යටි ගං සංවර්ධන ව්‍යාපෘතිය, තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය, කුඹුක්කන් ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය, මුන්දෙනි ආරු ගංගා නිම්න සංවර්ධන ව්‍යාපෘතිය, කිවුල් ඔය සංවර්ධන ව්‍යාපෘතිය, මොරගහකන්ද - කළුගඟ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය, පහළ මල්වතු ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සහ ඵලදායීතා ප්‍රවර්ධනය හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාව කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය යන ව්‍යාපෘති 09, 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක නොකිරීමට තීරණය කර තිබිණි. 2022 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 203,159ක පිරිවැයක් දරා තිබූ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පැවැති දුර්වල කළමනාකරණය හේතුවෙන් සැලැසුම් කළ පරිදි නිම කිරීමකින් තොරව අත්හැර දැමීමට සිදුව තිබිණි. ඒ අතුරින් ව්‍යාපෘති 7ක ප්‍රගතිය සියයට 0 සිට සියයට 13.16ක් වූ අවම මට්ටමක විය.

### ගිං, නිල්වලා අයථා ගෙවීම්

ගිං, නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2014 නොවැම්බර් 05 දින වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය සහ චීනයේ CAMEC සමාගම ඇ.ඩො. මිලියන 690ක කොන්ත්‍රාත් ගිවිසුමකට එළැඹ ඒ සඳහා වැඩ පූර්ව අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 4.35ක්වූ ඇ.ඩො. මිලියන 30ක් නොහොත් රු.මිලියන 4,011ක් ගෙවා අතහැර දමා තිබුණු අතර, ව්‍යාපෘතියේ සැලැසුම් සඳහාවූ සම්පූර්ණ පිරිවැයම 2014 වර්ෂයේ ගෙවා තිබියදී, සැලැසුම් කිරීම නිම කර නොතිබීම මත ඊට අදාළව දරා තිබූ රු. මිලියන 4,080ක පිරිවැයෙන් කිසිදු ආර්ථික ප්‍රතිලාභයක් ලැබී නොතිබිණි.

### උමා ඔය අයථා ගෙවීම්

ව්‍යාපෘතිය 2008 වර්ෂයේ ආරම්භ කර වසර 07කින් එනම් 2015 නොවැම්බර් 15 දින නිම කිරීමට මූලිකව අපේක්ෂා කර තිබුණද, 2023 මැයි 15 දින වන විට ව්‍යාපෘතියේ කටයුතු වසර 7කුත් මාස 6ක් ප්‍රමාද වී තිබීම හේතුවෙන් ජාතික විදුලිබල ජනන පද්ධතියට මෙගා වොට් 120ක විදුලි බලයක් එකතු නොවීම නිසා පමණක් සිදුව තිබූ පාඩුව රු. මිලියන 150,562ක්වී තිබිණි. ප්‍රමාදය ඇතුළු කරුණු 05ක් සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඇ.ඩො. මිලියන 181ක් රජයෙන් ඉල්ලා තිබිණි. ඒ සඳහා පත්කළ කමිටුවක් විසින් ඇ.ඩො. මිලියන 19ක මුදලක් ගෙවීමට නිර්දේශ කර තිබූ අතර, තවත් ඇ.ඩොලර් මිලියන 19ක් සානුකම්පික හේතු මත අමාත්‍ය මණ්ඩලයේ කැමැත්ත පරිදි කොන්ත්‍රාත්කරුට ගෙවීම සඳහා සලකා බැලීමටද නිර්දේශ කර තිබිණි. ඒ පිළිබඳ නිශ්චිතව සඳහන් කිරීමකින් තොරව 2021 ඔක්තෝබර් 31 දින අංක IR/2021/62 දරන අමාත්‍ය මණ්ඩල සන්දේශය ඉදිරිපත් කර තිබූ අතර, ඒ මඟින් ඇ.ඩොලර් මිලියන 38ක් අමතරව කොන්ත්‍රාත්කරුට ගෙවීමට අනුමැතිය ලබාගෙන තිබිණි.


කෙසේ වුවද, ව්‍යාපාතියේ ප්‍රධාන උමගෙහි ඇති වූ ජල කාන්දුව සඳහා වන්දි වශයෙන් කොන්ත්‍රාත්කරු විසින් රක්ෂණ සමාගමෙන්

07 පිටුවට

# ක්‍රිකට් ක්‍රීඩාව සහ බල දේශපාලනය
## ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය (ICC)

### ■ ICC ඉතිහාසය

ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය එහෙමත් නැත්නම් ICCය පිහිටුවනු ලබන්නේ 1909 ජුනි 15 වන දිනයි. එනම්, මීට වසර 114කට පමණ පෙරය. මෙහි මූලස්ථානය පිහිටා තිබෙන්නේ ඩුබායි, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේය. මේ වන විට රටවල් 108ක් ICC සාමාජිකත්වය දරනු ලබයි. මෙහි මුල් නාමය වූයේ 'අධිරාජ්‍යවාදී ක්‍රිකට් සම්මේලනය' ලෙස වන අතර, 1965දී එය 'ජාත්‍යන්තර ක්‍රිකට් සම්මේලනය' ලෙසටත්, 1989 වන විට වර්තමාන නිල නාමය වන 'ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය' බවටත් පත් විය.



### ■ ICC කාර්යභාරය

මෙම ආයතනය විසින් අන්තර් ජාතික ක්‍රිකට් තරග සංවිධානය කිරීම, පරිපාලනය කිරීම, නීති ක්‍රියාත්මක කිරීම, විශේෂයෙන්ම ලෝක කුසලාන තරග සංවිධානය කිරීම සිදුකරනු ලබයි. එමෙන්ම එක්දින සහ පන්දුවාර 20 අන්තර් ජාතික ක්‍රිකට් තරග සඳහා විනිසුරුවන් සහ පුහුණුකරුවන් පත්කිරීමද සිදු කරනු ලබයි. එමෙන්ම ඔවුන් විසින් ජාත්‍යන්තර ක්‍රිකට් සඳහා විනය පිළිබඳ වෘත්තීය ප්‍රමිතීන් සකසන ICC චර්යාධර්ම සංග්‍රහය ප්‍රකාශයට පත් කරනු ලබයි. ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය යටතේ ක්‍රියාත්මක වන දූෂණ විරෝධී ආරක්ෂක ඒකකය (ACSU) හරහා දූෂණයට සහ තරග පාවාදීම්වලට එරෙහිවද කටයුතු කරනු ලබයි.

2019 ජූලි සිට ඔක්තෝබර් දක්වා ICC විසින් සිම්බාබ්වේ ක්‍රිකට් එම රජයේ අනිසි මැදිහත්වීම හේතුවෙන් අත්හිටුවන ලදී. මෙවැනි අත්හිටුවීමක් පූර්ණ සාමාජික කණ්ඩායමක් සමග සිදුවූ පළමු අවස්ථාව වන අතරම 2023 නොවැම්බර් 10 වන දින ICCය විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ද ශ්‍රී ලංකා රජයේ අනිසි මැදිහත් වීම හේතුවෙන් අත්හිටුවන ලැබීය.

### ICCයට අනුබද්ධිත අනෙකුත් ආයතන

අප්‍රිකානු ක්‍රිකට් සංගමය (ACA) සාමාජිකයන් 22, ආසියානු ක්‍රිකට් කවුන්සිලය (ACC) සාමාජිකයන් 25, ඇමරිකානු ක්‍රිකට් ආයතනය (කස්ඵ) සාමාජිකයන් 17, ආසියා පැසිෆික් ක්‍රිකට් ආයතනය (EAP) සාමාජිකයන් 11, යුරෝපියානු ක්‍රිකට් කවුන්සිලය (ECC) සාමාජිකයන් 34.

### ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ ව්‍යුහය

මේ වන විට ICC සාමාජිකත්වය ලද රටවල් 108ක් සිටින අතර, ටෙස්ට් තරග ක්‍රීඩා කරන පූර්ණ සාමාජිකයන් 12ක් සහ සහකාර සාමාජිකයන් 96ක් වේ. පූර්ණ සාමාජිකත්වය ලද රටවල් හට කවුන්සිලයේ ඡන්ද අයිතිය හිමි වේ. ජාත්‍යන්තර තරගාවලියේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය මත පදනම්ව පූර්ණ සාමාජික තත්ත්වයට උසස් වීමේ හැකියාව ICC සහකාර සාමාජිකයන්ට හිමිවේ. මෙම කවුන්සිලයේ වර්තමාන සභාපතිවරයා වන්නේ Greg Barclay ය. ICCය යටතේ ප්‍රධාන කමිටු 13ක් ක්‍රියාත්මක වන අතර මෙහි ප්‍රධාන විධායක කමිටුවේ ව්‍යුහය වන්නේ සභාපති, ස්වාධීන කාන්තා අධ්‍යක්ෂ සහ විධායක අධ්‍යක්ෂයි. සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධානියා වේ. මෙම ප්‍රධාන විධායක කමිටුවට රටවල් 12ක් නියෝජනය කරමින් එක් සාමාජිකයකු බැගින්ද, අනෙකුත් රටවල් නියෝජනය කරමින් සාමාජිකයන් 03ක් ද පත් වී තිබේ.

### ■ ICC වාණිජමය තත්ත්වය

ICC ආයතනය විසින් සංවිධානය කරන තරගාවලිවලින්, මූලික වශයෙන් ක්‍රිකට් ලෝක කුසලානයෙන් ආදායමක් උපයා ගන්නා අතර, එම ආදායමෙන් වැඩි ප්‍රමාණයක් එහි සාමාජිකයන්ට බෙදාහරිනු ලබයි. ලෝක කුසලාන තරගාවලියේ අනුග්‍රාහකත්වය සහ රූපවාහිනී අයිතිය 2007 සහ 2015 අතර ICCහි ප්‍රධාන ආදයම් මාර්ගය වූ අතර, එය ඇමෙරිකානු ඩොලර් බිලියන 1.6කට අධික ආදායමක් ගෙන ආවේය. එමෙන්ම, 2007 ලෝක කුසලාන තරගාවලියෙන් ලද ඇ.ඩොලර් මිලියන 239ද ඇතුළුව, මුළු ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 285.87ක් විය. එම කාලය තුළ ඔවුන්ට ඩොලර් මිලියන 6.695ක ආයෝජන ආදායමක්ද හිමි විය. 2022දී ICC ශුද්ධ ආදායම ලෙස ඇමෙරිකානු ඩොලර් මිලියන 431.93ක් උපයා ඇති අතර, ඉදිරි වසර සඳහා ඩොලර් මිලියන 600ක ආදායමක් බලාපොරොත්තු වනු ලබයි.

### ICC සහ ක්‍රිකට් දූෂණ වංචා අනාවරණය

ප්‍රමුඛ පෙළේ ක්‍රිකට් ක්‍රීඩකයන් සම්බන්ධ මත්ද්‍රව්‍ය හා අල්ලස් වංචා සම්බන්ධයෙන්ද ICCයට කටයුතු කිරීමට සිදුවී ඇත. ICCය විසින් 2000දී ලන්ඩනයේ මෙට්‍රොපොලිටන් පොලිසියේ විශ්‍රාමික කොමසාරිස් කොන්ඩන් සාමිවරයා යටතේ දූෂණ විරෝධී සහ ආරක්ෂක ඒකකයක් (ACSU) පිහිටුවන ලදී. ඔවුන් වාර්තා කර ඇති දූෂණ අතර හිටපු දකුණු අප්‍රිකානු නායක හැන්සි ක්‍රොන්ජේ, අඩු දස්කම් දැක්වීමට හෝ ඇතැම් තරග කලින් තීරණය කළ ප්‍රතිඵලයක් සහතික කිරීම සඳහා ඉන්දීය බුකිකරුවකුගෙන් සැලකිය යුතු මුදලක් ලබාගෙන ඇති බවද අනාවරණය වේ. ඒ හා සමානව හිටපු ඉන්දීය නායක මොහොමඩ් අසාරුදීන් සහ අජේ ජඩේජා පිළිබඳව විමර්ශනය කර තරග පාවාදීම් සම්බන්ධයෙන් වැරැදිකරුවන්වූ අතර, ක්‍රිකට් ක්‍රීඩා කිරීම තහනම් කරන ලදී (පිළිවෙලින් ජීවිතාන්තය දක්වා සහ වසර පහකට). එමෙන්ම ඕස්ට්‍රේලියානු ක්‍රීඩකයන් වන ඩේවිඩ් වෝර්නර්, කැමරන් බැන්ක්‍රොෆ්ට්, ස්ටීව් ස්මිත් යන ක්‍රීඩකයන්ද මෙලෙස චෝදනාවලට ලක්ව තරග තහනමට ලක්වී ඇත. ශ්‍රී ලාංකීය ක්‍රීඩකයන් හටද වරින්වර චෝදනා එල්ලවී ඇති අතර, සචිත්‍ර සේනානායක, දිල්හාර ලොකුහෙට්ටි සහ නුවන් සොයිසා ඒ අතර වේ. ACSU විසින් ක්‍රිකට් ක්‍රීඩාවේ දූෂණ පිළිබඳ ඕනෑම වාර්තාවක් අධීක්ෂණය කිරීම සහ විමර්ශනය කිරීම සිදුකරන අතර, 2010 වසරේ පකිස්ථාන ක්‍රීඩකයන් තිදෙනකු වන මොහොමඩ් අමීර්, මොහොමඩ් අසීෆ් සහ සල්මන් බට් යන අය ස්ථාන පාවාදීම සම්බන්ධයෙන් වරදකරුවන්වූ අතර, ඔවුන්ට පිළිවෙළින් වසර 5, 7 සහ වසර 10ක් බැගින් තරග තහනමක් පනවා ඇත. 2011 නොවැම්බර් 3වන දින, බට්ට මාස 30ක සිරදඬුවමක්ද, අසීෆ්ට වසරක් ද, අමීර්ට මාස හයක් ද, අල්ලස් සඳහා පහසුකම් සැපයූ ක්‍රීඩා නියෝජිතයා වූ මජීඩ්ට වසර දෙකයි මාස අටක්ද සිරදඬුවම් නියම කරන ලදී. 2019දී 'අල් ජසීරා' නාලිකාව විසින් කරන ලද පරීක්ෂණයකින් ශ්‍රී ලංකාව, ඉන්දියාව, එංගලන්තය, ඕස්ට්‍රේලියාව සහ අනෙකුත් ක්‍රිකට් ක්‍රීඩා කරන රටවල තරග පාවාදීම් සිදුකරන බව වැඩිදුරටත් අනාවරණය කෙරිණි.

### ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය (SLC)

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව හා සම්බන්ධ ක්‍රියාකාරකම් හා එහි කටයුතු පාලනය කරන ප්‍රධානතම ආයතනයයි. මෙය ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ සහ ආසියානු ක්‍රිකට් කවුන්සිලයේ පූර්ණ සාමාජිකත්වය දරනු ලබන අතර මෙමගින් ජාතික ක්‍රිකට් කණ්ඩායම් තරග සහ පළමු පෙළ තරග පවත්වනු ලබයි. මෙම ආයතනය 1975 ජුනි මස 30 දිනදී ක්‍රීඩා අමාත්‍යාංශයේ ලියාපදිංචිව ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය ලෙස ආරම්භ කෙරුණු අතර, පසුව එය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ලෙස වර්ෂ 2003දී පිහිටුවන ලදී.

### SLC ව්‍යුහය

නීති ප්‍රකාරව වසර හතරකට වරක් පැවැත්වෙන ඡන්ද විමසීමකින් ආයතනය සඳහා නියෝජිතයන්

07 පිටුවට

# මානව පරිණාමය පිළිබඳ නූතන

**පසුගිය කලාපය හා සම්බන්ධයි**


## හෝමෝ ඉරෙක්ටස්
(Homo Erectus)

සොබාදහමේ අභියෝග ජයගැනීම සඳහා සාමූහික ක්‍රියාකාරීත්වයක් පැවති බවට විශ්වාස කරන පැරණිතම මානව විශේෂය හෝමෝ ඉරෙක්ටස් වේ. මෙම මානවයාට ඍජු කාය විලාසයක් සහිතව ඇවිදීම කළ හැකිවූ නිසා ඉංග්‍රීසියෙන් 'ඍජු' යන අදහස ගෙනදෙන Erect (ඉරෙක්ට්) යන වචනය ආශ්‍රයෙන් ඉරෙක්ටස් යන නාමය ගොඩනගා ඇත. 1891 දී මෙම විශේෂයට අයත් පොසිලයක් නෙදර්ලන්ත ජාතික විද්‍යාඥයකුවූ ඉයුජින් ඩුබොයිස් විසින් ප්‍රථම වරට සොයාගන්නා ලදී. එය සොයාග න්නා ලද්දේ ජාවා දූපතෙන් වීම නිසා 'ජාවා මිනිසා' ලෙස ප්‍රචලිත වූ අතර ඒ වන තෙක් සොයාගෙන තිබූ පැරණිතම මානව පොසිලයද එය විය. මෙම පොසිලයට මුල්වරට නම් තබන ලද්දේ 'පිතකැන්ත්‍රොපස් ඉරෙක්ටස්' ලෙසය.


එවකට විද්‍යාඥයින් බොහොමයක් විශ්වාස කරන ලද්දේ මිනිසා මුලින්ම බිහිවූයේ අග්නිදිග ආසියානු කලාපය අශ්‍රිත ප්‍රදේශයන්ගේ බවයි. (චාර්ල්ස් ඩාවින් ඇතුලු සමහර විද්‍යාඥයින් එවකටත් පැවසුයේ මානවයා බිහිවූයේ අප්‍රිකාවෙන් බවයි. අප්‍රිකානු කලාපයෙන් හමුවන ගෝරිල්ලන් සහ චිම්පන්සීන් ආදී සතුන් මානවයාට වඩාත් සමීප ලක්ෂණ පැවතීම ඊට හේතුවයි.) එහෙත් අනෙකුත් පූර්ව මානව විශේෂ මෙන්ම හෝමෝ ඉරෙක්ටස් ද බිහිවූයේ අප්‍රිකානු කලාපය ආශ්‍රිතව බව පසුකාලීනව තහවුරු වී ඇත. 1927 දී කැනේඩියානු විද්‍යාඥයකු වූ ඩේවිඩ්සන් බ්ලැක් විසින් චීනයේ බීජිං නගරයට ආසන්නව පිහිටි ශොකෝව්ඩියන් ගුහාවෙන් තවත් පොසිලයක් සොයාගත් අතර එය 'ශිනැන්ත්‍රොපස් පීකිනෙන්සිස්' (පීකිං මිනිසා) ලෙස නම් තබන ලදී. පසුකාලීනව මෙම ප්‍රදේශය ආශ්‍රිතව තවත් 44 දෙනෙකුට පමණ අයත් පොසිල කොටස් මෙන්ම ඔවුන් භාවිත කල ගල් ආයුධ සහ ඒවා නිපදවූ ස්ථානද හමුවීමත් සමග වැඩි වශයෙන් තොරතුරු ගවේශණය කිරීමට විද්‍යාඥයින්ට හැකියාව ලැබිණි.

ජාවා මිනිසාගේ සහ පීකිං මිනිසාගේ සමානකම් අධ්‍යනය කල ජර්මන්-ඇමරිකන් ජාතික විද්‍යාඥ අර්නස්ට් වෝල්ටර් මේයර් විසින් මෙම විශේෂයන් දෙකටම හෝමෝ ඉරෙක්ටස් යන නාමය 1950දී ලබා දෙන ලදී. 1949 පටන් අප්‍රිකානු කලාපය ආශ්‍රිතව ද හෝමෝ ඉරෙක්ටස් පොසිල හමුවී ඇත. මින් පෙර විසූ මානව විශේෂ නැගෙනහිර සහ දකුණු අප්‍රිකානු කලාපයට පමණක් සීමා වී තිබුණද හෝමෝ ඉරෙක්ටස් සමස්ත අප්‍රිකාවත්, යුරෝපයේ සමහර ප්‍රදේශයන්ගේත්, ආසියාවේ සහ අග්නිදිග ආසියාවේත් පැතිර සිටි බවට සාක්ෂි ලැබී ඇත. මුල්ම වරට අප්‍රිකානු මහද්වීපයෙන් පිටත්ට ගමන්කල මානවයා ලෙස හෝමෝ ඉරෙක්ටස් හැඳින්වෙන්නේ එබැවිණි.

පොදු පිළිගැනීම අනුව අප්‍රිකානු කලාපයේ සිටි හෝමෝ හැබිලිස් පරිණාමයේ ප්‍රතිඵලයක් ලෙස අදින් වසර මිලියන 2කට පමණ පෙර හෝමෝ ඉරෙක්ටස් බිහිවී ඇත. දැනට හමුවී ඇති පැරණිතම හෝමෝ ඉරෙක්ටස් පොසිල අතර වසර මිලියන 2ක් පමණ පැරණි පොසිල අප්‍රිකානු මහද්වීපය ආශ්‍රිතවත්, වසර මිලියන 1.8ක් පමණ පැරණි පොසිල ජාවා දූපත් ආශ්‍රිතවත් හමුවී ඇත. එසේම අදින් වසර 75,000ක් පමණ පමණ වන තෙක් හෝමෝ ඉරෙක්ටස් මිහිමත වාසය කර ඇති බවට සාක්ෂි ද ලැබී ඇත. ඒ අනුව සැලකූ විට ආසන්න වශයෙන් වසර මිලියන 2ක පමණ කාලයක් හෝමෝ ඉරෙක්ටස් මිහිමත වාසය කර ඇත.





වසර ලක්ෂ 14 කට හා වසර ලක්ෂ 8 කට




හෝමෝ ඉරෙක්ටස් භාවිතා කළ ආයුධ

2011දී කරන ලද පර්යේෂණයක් ආශ්‍රයෙන් සමහර විද්‍යාඥයින් පවසන්නේ හෝමෝ හැබිලිස් විශේෂයෙන් කොටසක් බටහිර ආසියා කලාපය වෙත සංක්‍රමණය වී හුදකලාව පරිණාමය වීමේ ප්‍රතිඵලයක් ලෙස ඉරෙක්ටස් බිහිවූ බවත්, ඉන්පසු ඔවුන් අග්නිදිග ආසියාවට, නැගෙනහිර ආසියාවට මෙන්ම ආපසු අප්‍රිකාවට ද පැතිරගිය බවත් ය. කෙසේ නමුත් එය මෙතෙක් පොසිල සාක්ෂි හරහා තහවුරු කර නොමැත. නමුත් කුමන හෝ මානව වර්ගයක් විසින් භාවිතා කරන ලද වසර මිලියන් 2.12ක් පැරණි ගල් ආයුධ චීනය ආශ්‍රිතව සොයාගෙන ඇති බව 2018දී වාර්තා විය. (එම වාර්තා අනුව අප්‍රිකානු මහද්වීපයෙන් පරිබාහිරව මෙතෙක් සොයාගෙන ඇති පැරණිතම ගල් ආයුධ ඒවා වේ.) ඒවා මෙතෙක් සොයාගෙන ඇති පැරණිතම හෝමෝ ඉරෙක්ටස් පොසිලවලට ද වඩා පැරණිය. ඒ අනුව සලකා බැලූවිට හෝමෝ ඉරෙක්ටස්, බිහිවන්නට ඇතැයි අපි මෙතෙක් විශ්වාස කරන ලද කාලයට පෙර බිහිව තිබිය යුතුය. එසේත් නැත්නම් හෝමෝ ඉරෙක්ටස්ට පෙර සිටි මානව විශේෂයක් ඊට පෙර ආසියාවට සංක්‍රමණය වී තිබිය යුතුය. එසේ සංක්‍රමණය වී ඇත්නම් අප මෙතෙක් දන්නා මානව පරිණාමය පිළිබඳ කතාන්දරයේ සමහර තැන් වෙනස් කිරීමට සැලකියයුතු බලපෑමක් කරනු ඇත.



Turkana Boy
අස්ථි පද්ධතිය හා ආශ්‍රිත අනුරුව




හෝමෝ ඉරෙක්ටස් හිස්කබලක්
(පීකිං මිනිසා)

හෝමෝ ඉරෙක්ටස්ගේ කපාල ධාරිතාව ඝන සෙ.මී. 546 සහ ඝන සෙ.මී. 1251 අතර පැතිර පවතී. පොදුවේ එය ඝන සෙ.මී. 1050 පමණ යැයි සලකනු ලබයි. එමෙන්ම මෙම විශේෂයට අයත් මානව හිස්කබල් නූතන මානවයාට වඩා ඝනකමින් වැඩි ලෙස නිර්මාණය වී ඇත්තේ පැරණි මානව විශේෂයන්ට සමාන කම් දක්වමිනි. ජාවා වලින් හමුව ඇති අවුරුදු 1ක් පමණ වයසැති හෝමෝ ඉරෙක්ටස් දරුවාගේ හිස්කබල අනුව සාමාන්‍ය වැඩුනු මිනිසෙකුගේ මෙන් 72% - 84% පමණ


# ගවේෂණ

## 06 වන කොටස




පෙර හෝමෝ ඉරෙක්ටස් පැතිර සිටි ප්‍රදේශ





හෝමෝ ඉරෙක්ටස් විසින් වසර ලක්ෂ 5 කට පමණ පෙර කරන ලද කැටයමක්

ප්‍රමාණයක මොළයක් එම දරුවා සතුවී ඇත. එතරම් වේගයෙන් මොළය වර්ධනය වීම වත්මන් මානවයාට වඩා වෙනස් වන අතර ආදී වානරයින්ට වැඩි සමානකමක් දක්වයි. ඒ අනුව ඉරෙක්ටස්ට තිබී ඇත්තේ වත්මන් මානවයාට සාපේක්ෂව කෙටි ළමා කාලයකි. එමනිසා දිගු කාලයක් ඔවුනට රැකවරණය ලබාදීමට මව්වරුන්ට සිදුවන්නේ ද නැත.




හෝමෝ ඉරෙක්ටස් වැඩිහිටි ගැහැණු අනුරුවක්

කෙසේ නමුත් පැරණි මානව විශේෂයන්ට සාපේක්ෂව පැතලි මුහුණක් පැවතීමත්, නාසය මුහුණින් පිටතට නෙරා පිහිටීමත් විශේෂත්වයකි. එසේ නාසය පිහිටීම නිසා ඉරෙක්ටස්ට ගඳ සුවඳ පැමිණෙන දිශා පිළිබඳ පහසුවෙන් සොයාගැනීමට හැකියාව ලැබී තිබූ බවත්, නාසයේ තෙතමනය පවත්වා ගනිමින් වියළි වාතය ආශ්වාසය කිරීමේ හැකියාව පැවති බවත් විශ්වාස කරයි. අප්‍රිකානු කලාපයට සීමා නොවී ලොව පුරා පැතිර යාමට

ඉරෙක්ටස්ට එම කාරණා වැදගත් වන්නට ඇත. ඒ අතරම ඇසට ඉහලින් ඇහි බැම ආශ්‍රිතව හිස්කබල වැඩි වශයෙන් පිටතට නෙරා ඇති බව පැහැදිලිව දැකිය හැක.

පැරණි මානව විශේෂයන්ට සාපේක්ෂව තුනී එනැමලයක් සහිත කුඩා දත් මොවුන් සතුවිය. සාමාන්‍යයෙන් වැඩුනු හෝමෝ ඉරෙක්ටස් මානවයෙක් අඩි 4 අඟල් 9ක් - අඩි 6ක් පමණ උසින් සහ කි.ග්‍රෑම් 40 - 70 පමණ බරකින් යුතු විය. එසේම අනෙකුත් වානර විශේෂ සහ පූර්ව මානව විශේෂවල පැවති ආකාරයට ස්ත්‍රී සහ පුරුෂ මානවයින් අතර ශරීර ප්‍රමාණයන්ගේ වෙනස ඉතා අවම විය. උස මෙන්ම බරද ආසන්න වශයෙන් සමාන විය. ඒ අනුව හෝමෝ හැබිලිස් පිරිමි අයකුට සාපේක්ෂව හෝමෝ ඉරෙක්ටස් පිරිමි අයකු පරිණාමය තුල වැඩි වූ උසට වඩා හෝමෝ හැබිලිස් ගැහැණු අයෙකුට සාපේක්ෂව හෝමෝ ඉරෙක්ටස් ගැහැණු අයෙකුගේ වැඩි වී ඇති උස සාපේක්ෂව බොහෝ වැඩිය. තමන්ට ශරීර විශාලත්වයෙන් සමාන, එසේම තෝරාගත් අය (බොහෝවිට තෝරාගත් එක් අයකු) සමග පමණක් ලිංගික සබඳතාවයන් පැවැත්වීමට මෙම මානවයින් කටයුතු කල නිසා, මෙලෙස ශරීර විශාලත්වය සමාන මට්ටමට පරිණාමය සිදුවන්නට ඇතැයි විද්‍යාඥයින් මතපලකර ඇත.




වසර මිලියන 1.5 ක් පැරණි කෙන්යාවෙන් හමුවූ හෝමෝ ඉරෙක්ටස් පා සලකුණු

මෙම ශරීර ලක්ෂණ වත්මන් මිනිසාට බොහෝ සේ සමාන වේ. එමෙන්ම නූතන මානවයාගේ ගමන් විලාශයට සමාන ගමන් විලාශයකින් හෙබි පළමු මානව විශේෂය ද මොවුන් විය. දිගු ඉලක්කයක් වෙත යමක් විසි කිරීමට හැකි ආකාරයට උරහිස් සැකසී තිබී ඇත. සිසිල් පරිසරයට ගැලපෙන ලෙස රෝම වලින් වැසී තිබුණු ඔස්ත්‍රලෝපිතකස් විශේෂයන්ගේ සිරුර පරිණාමයේදී රෝම නොමැති සමක් බවට පත්වූයේ කුමන අවධියේ දැයි නිශ්චිත නොවූවත් හෝමෝ ඉරෙක්ටස් සිරුර වත්මන් මානවයාට සමානව රෝම වලින් අවම වන්නට ඇතැයි විශ්වාස කෙරේ. පසුකාලීනව ඇඳුම් භාවිතාව සඳහා මගපාදන ලද්දේ මෙම තත්වයයි. ඇඳුම් භාවිතය පිළිබඳ මෙතෙක් සොයාගෙන ඇති පැරණිතම සාක්ෂිය වන්නේ වසර ලක්ෂ 7.8ක් පැරණි ඇඳුමක් භාවිතා කරන්නට ඇතැයි සැලකෙන සත්ව හමකි. හෝමෝ ඉරෙක්ටස් ඇඳුම් භාවිතා කර ඇති බව නිශ්චිත ලෙස සාක්ෂි නොතිබුනද, ඔවුන්ට සමකාලීන අතීතයේ ඇඳුම් භාවිතා කර තිබීමත්, ශීත ප්‍රදේශවල ජීවත් වීමත්, රෝම අවම වීමත්, ඔවුන්ගේ බුද්ධි මට්ටමත් සැලකූ විට ඔවුන් විසින් ඇඳුම් භාවිතා කරන්නට ඇතැයි සිතිය හැක.

කෙන්යාවේ ඉලරෙට් ප්‍රදේශයෙන් වසර මිලියන 1.5ක් පැරණි හෝමෝ ඉරෙක්ටස් පා සලකුණු හමුව ඇති අතර ඒවා පිරිමි පුද්ගලයින් 20 දෙනෙකුට පමණ අයත් පා සළකුණු ලෙස පරීක්ෂණ මගින් තහවුරු වී ඇත. ඒ අනුව විද්‍යාඥයින් නිගමනය කරන්නේ හෝමෝ ඉරෙක්ටස් පිරිමි කණ්ඩායම් එක්ව දඩයමේ යෑම, භූමි නිරීක්ෂණය ආදිය සිදුකරන්නට ඇති බවයි. එය නිවැරදි නම් කාන්තා, පිරිමි ලෙස ලිංගිකත්වය අනුව සමාජ කාර්යභාරය වෙන්වීම හෝමෝ ඉරෙක්ටස් අවධියේම තිබෙන්නට ඉඩකඩක් ඇත.

වඩා තියුණු ගල් ආයුධ සෑදීමේ දක්ෂතාවයක් ඉරෙක්ටස් සතුවිය. දෙපසම මුවහත් හෙලිතුඩු, පිහි ආකාරයේ ගල් ආයුධ මෙන්ම තර්කානුකූලව සිතා, පූර්ව සැලසුමක් සහිතව නිපදවිය යුතු වූ තුනී ගල් පතුරුද ඔවුන් නිපදවා ඇත. මස්, පැලෑටි පහසුවෙන් ආහාරයට ගත හැකි ආකාරයට සකසා ගැනීමට මෙන්ම ලි දඬු කැපීම ආදී විවිධාකාර වූ ක්‍රියාවන් සඳහා ඔවුන් මෙම ගල් ආයුධ භාවිතා කරන්නට ඇත. හෝමෝ ඉරෙක්ටස් බෙලි කටුවලින් නිපදවූ ආයුධ ද ජාවා ආශ්‍රිතව හමුවී ඇත. එසේම ලණු ආකාරයේ රැහැන් ඔවුන් විසින් භාවිතා කරන්නට ඇතැයි ද ගල් ආයුධ විසිකිරීමට ඒවා භාවිතා කරන්නට ඇතැයි ද විද්‍යාඥයින් මත පලකර ඇත. චීනය ආදී ප්‍රදේශවල ජීවත් වූ මෙම මානවයින් බට ලී ද ආයුධ නිපදවා ගැනීමට භාවිතා කරන්නට ඇතැයි විශ්වාස කෙරේ.

ගින්දර භාවිතා කිරීම සම්බන්ධයෙන් හැකියාව තිබූ පැරණිතම මානව විශේෂය වන්නේ හෝමෝ ඉරෙක්ටස් වේ. දකුණු අප්‍රිකාවෙන් හමුවූ වසර මිලියන 1.7ක් පැරණි ගිනිමැලයක සළකුණු ද, කෙන්යාවෙන් හමුවූ වසර මිලියන 1.5ක් පැරණි ගිනිමැලයක සලකුණු ද ගින්දර භාවිතය පිළිබඳව දැනට හමුවී ඇති පැරණිතම සාක්ෂි වේ. ගින්දර සොයාගැනීම එක් තැනකින් ආරම්භ වී ලොව පුරා පැතිරුණා නොව අවස්ථා කිහිපයකදී වෙන් වෙන් වශයෙන් එක් එක් ප්‍රදේශවල එය සිදුව ඇත. ඒ අතරතුර සමහර

06 පිටුවට

## මානව පරිණාමය ..... 4-5 පිටුවෙන්

තැනක සොයාගෙන තිබූ එම තාක්ෂණය එම ගෝත්‍ර සමගම නැතිව ගොස් ද ඇත. දවසේ වැඩි වේලාවක් වැඩ කිරීමට, විලෝපිකයින්ගෙන් ආරක්ෂා වීමට ගස් උඩ නිදාගැනීම වෙනුවට ආරක්ෂාකාරීව බිම නිදාගැනීමට, ශීත සෘතු සහිත ධ්‍රැවාසන්න ප්‍රදේශවලට සංක්‍රමණය වීමට ආදී තවත් බොහෝ කාරණා සඳහා ද ගින්දර සොයාගැනීම වැදගත් විය.

මොළයේ වර්ධනය සමග සැලකූ විට ආහාර ලෙස වැඩි ප්‍රෝටීන ප්‍රමාණයක් ලබාගැනීමේ අවශ්‍යතාව ඉරෙක්ටස්ට තිබිණි. මේ නිසා ඔවුන්ගේ ප්‍රධාන ආහාරය මස් වූ අතර කණ්ඩායම් ලෙස එක්ව, සාමූහිකව දඩයමේ ගිය මුල්ම මානව විශේෂය ලෙස ඉරෙක්ටස් හඳුනාගත හැක. අලි ඇතුන්, වල් ඌරන්, හිපපොටේමස්, රයිනෝසිරස් ආදී සතුන් මස් පිණිස අල්ලාගැනීම සඳහා සැලසුම් සහගතව කණ්ඩායමක් ලෙස ඔවුන් කටයුතු කර ඇත. එසේම වත්මන් ඊශ්‍රායලයේ එක් කැණීම් ස්ථානයකින් පළතුරු, එළවලු, ධාන්‍ය, ඇටවර්ග ආදී වර්ග 55කට අයත්, ඉරෙක්ටස් විසින් ආහාර සඳහා භාවිතා කල දේ සොයාගෙන තිබේ. එසේම මාළුන්, කැස්බෑවන්, කිඹුලන් ආදී ජලාශ්‍රිත සතුන්ද අනුභව කර ඇති බවට වසර මිලියන 1.9කට වඩා පැරණි සාක්ෂි කෙන්යාව ආශ්‍රිතව සොයාගෙන ඇත. ගින්දර සොයාගැනීම නිසා මස් පුලුස්සා අනුභව කිරීමට ඉරෙක්ටස්ට හැකියාව තිබුණද එය සිදුකල බවට පිළිගත හැකි මට්ටමේ සාක්ෂි මෙතෙක් හමුව නැත. වසර ලක්ෂ 4කට පමණ පෙර සිටි මානව විශේෂ මස් පුලුස්සා අනුභව කල බවට සාක්ෂි පැවතුන ද ඒ ඉරෙක්ටස් විශේෂයම ද යන්න නිශ්චිතව කිව නොහැක.

ඉරෙක්ටස් ගල්ගුහා මෙන්ම තමන් විසින් සාදන ලද වාසස්ථාන ද සිය වාසය සඳහා භාවිතා කර ඇති බවට සාධක හමුවී ඇත. එලෙස සාදන ලද වාසස්ථාන පිළිබඳව ඇති පැරණිතම සළකුණු අවුරුදු මිලියන 1.75ක් තරම් පැරණි වේ. එමෙන්ම ශීත කාලයේදී ගින්දර දල්වා උණුසුම ලබාගත හැකි ආකාරයෙන් නිමවූ වාසස්ථාන පිළිබඳ පැරණිතම සාක්ෂි චෙක් ජනරජයෙන් හමුවේ. එය අදින් වසර ලක්ෂ 7ක් පැරණිය.

ඉන්දුනීසියාවේ මුහුදින් වටවූ දූපත්වල පවා ඉරෙක්ටස් ජීවත්වූ බවට සාක්ෂි පැවතීමෙන් පෙනීයන්නේ ඔවුන් නාවික ගමනාගමන කටයුතු පවා සිදුකර ඇති බවයි. මෙම සාක්ෂි අදින් වසර මිලියනයක් පමණ ඈතට දිවයයි. එසේනම් මාසයක පමණ කාලයක් සැලසුම් සහගතව ගමනාගමනයේ යෙදීමට ඉරෙක්ටස්ට හැකියාව තිබී ඇත.

ඉරෙක්ටස් මානවයකු විසින් 'සිග් සැග්' කැටයමක් යෙදූ වසර ලක්ෂ 5.4-4.3 පමණ පැරණි සිප්පිකටුවක් ජාවා ආශ්‍රිතව හමුවී ඇත. එය මානවයකු විසින් එවන් කලා කෘතියක් කල බවට හමුව ඇති පැරණිතම සාක්ෂිය වේ. එසේම ඔවුන් විසින් නිපදවූ වර්ණ ද අප්‍රිකානු කලාපයේ පුරාණ ඉරෙක්ටස් ජනාවාස ආශ්‍රයෙන් හමුවී ඇත.

ඉරෙක්ටස්ගේ සිට පරිණාමය වූ මානව විශේෂවලට භාෂාවක් කතාකිරීමට හැකිවූ නිසා, ඔවුන්ගේ පූර්වජයා වූ හෝමෝ ඉරෙක්ටස්ට ද භාෂාවක් පවතින්නට ඇතැයි ඇතමෙක් තර්ක කරයි. එසේම භාෂා භාවිතාව සඳහා අවශ්‍ය මට්ටමට, වචන නිර්මාණයට සහ වාක්‍ය පෙළගැස්මට අවශ්‍ය මට්ටමට මොළය පරිණාමය වී පැවතීමද එයට තවත් එක් හේතුවකි. එහෙත් ඉරෙක්ටස්ගේ උගුර සහ මුඛය ආශ්‍රිත පේශි පිහිටීම පිළිබඳ ඇති උපකල්පන මත සමහර විද්‍යාඥයින් පවසන්නේ ඔවුනට භාෂාවක් කතාකිරීමේ හැකියාවක් නොවූ බවයි. කෙසේ නමුත් හඬ හැසිරවීමේ ගැටලු නිසා කතාකිරීමේ හැකියාවක් නොවූවද ප්‍රාථමික භාෂාවක් හෝ ඉරෙක්ටස්ට පවතින්නට ඇති බව පොදු පිළිගැනීමයි.

අප්‍රිකානු කලාපය ආශ්‍රිතව සොයාගෙන ඇති ඉරෙක්ටස් විශේෂයට අයත් යැයි පැවසූ පොසිල බොහොමයක් හෝමෝ අර්ගාස්ටර් විශේෂයට අයත් යැයි අද වන විට වර්ග කර ඇත. එසේම සමහර විද්‍යාඥයින් පවසන්නේ හෝමෝ අර්ගාස්ටර් පෙර බිහිවූ බවත් හෝමෝ ඉරෙක්ටස් පරිණාමය වූවේ ඔවුන්ගෙන් බවත්ය. එසේම තවත් සමහර විද්‍යාඥයින් ඉරෙක්ටස් ආසියානු විශේෂයක් ලෙසත් අර්ගාස්ටර් යනු සුලු වෙනස්කම් සහිත එහිම අප්‍රිකානු විශේෂය ලෙසත් සලකයි.

ඉරෙක්ටස් මිහිමත වාසය කල කාලය තුල එක් එක් කාල වකවානුවේදී ඔවුන් හා සමගිමීව, විවිධ ප්‍රදේශවල මිනිසා විසින් දැනට හඳුනාගෙන ඇති සියලුම මානව විශේෂ ජීවත්ව ඇත. එසේම ඔස්ත්‍රෙලෝපිතකස් සෙඩීබා, පැරුැන්ත්‍රොපස් බොයිසෙයි, පැරුැන්ත්‍රොපස් රෝබස්ටස් ආදී විශේෂද සමාන්තර කාලවල මිහිමත වාසය කර ඇත. වත්මන් මිනිසා පරිණාමය වූයේ හෝමෝ ඉරෙක්ටස් ගෙන් යැයි නිශ්චිතව කිව නොහැකි මුත්, සේපියන් මෙන්ම නියැනඩර්තාල් මානවයාද පරිණාමය වූයේ හෝමෝ ඉරෙක්ටස්ගෙන් යැයි බොහෝ විද්‍යාඥයින් විශ්වාස කරයි.

තවත් කොටසක් මීලඟ කලාපයෙන්...

## ගෝලීය නිෂ්පාදනය පිළිබඳ ....... 01 - පිටුවෙන්

චීනය සහ එක්සත් ජනපදය අතරයි. ලෝක නිෂ්පාදනයේ වැඩි පංගුව එක්සත් ජනපදය හිමි කර ගත්තද ලෝක වෙළෙඳාමේ වැඩි පංගුව අත්පත් කරගැනීමට චීනය සමත්වී ඇත. එම සන්දර්භය තුළ ලංකාවට ලෝක අපනයන වෙළෙඳාම තුළ අත්පත්වී ඇත්තේ, 0.052% ක කොටසකි.

මෙම වෙළෙඳමට අනුරූපව ආදායම අනුව ලොව විශාලම සමාගම් 10න් 08ක් අයත් වන්නේ චීනයට සහ එක්සත් ජනපදයටයි. එය පහත වගු අංක 04 සටහනින් පැහැදිලි වේ. ඉහත සටහනට අනුව ලොව විශාලතම සමාගම් 10න් 5ක් එක්සත් ජනපදයටත්, 03ක් චීනයටත් අයත් වේ. චීනයට අයත් සමාගම් 03ම රාජ්‍ය සමාගම් වීමත්, ඒවා තෙල් සහ විදුලිබල ක්ෂේත්‍රයේ වීමත් විශේෂයකි. එහෙත් එක්සත් ජනපදයට අයත් සමාගම් 05 න් දෙකක් සිල්ලර වෙළෙඳාමට අයත්ය.

**ආදායම අනුව ලොව විශාලම සමාගම් - 2022 (වගු අංක - 04)**

| ස්ථානය | සමාගම | රට | කර්මාන්තය | USD Billion |
|---|---|---|---|---|
| 01 | වොල්මාට් | එක්සත් ජනපදය | සිල්ලර වෙළඳාම | 611 |
| 02 | සවුදි ඇරම්කො | සවුදි අරාබිය | තෙල් හා ගෑස් | 603 |
| 03 | ස්ටේට් ග්‍රිඩ් කෝපරේෂන් ඔෆ් චයිනා | චීනය | විදුලිබල | 530 |
| 04 | ඇමසන් | එක්සත් ජනපදය | සිල්ලර වෙළෙඳාම | 513 |
| 05 | විටෝල් | ස්විට්සර්ලන්තය | පාරිභෝගික භාණ්ඩ | 505 |
| 06 | චයිනා නැෂනල් පෙට්‍රෝලියම් කෝපරේෂන් | චීනය | තෙල් හා ගෑස් | 483 |
| 07 | චයිනා පෙට්‍රෝ කෙමිකල් කෝපරේෂන් | චීනය | තෙල් හා ගෑස් | 471 |
| 08 | එක්සෝන් මොබිල් | එක්සත් ජනපදය | තෙල් හා ගෑස් | 413 |
| 09 | ඇපල් | එක්සත් ජනපදය | ගෘහ උපකරණ | 394 |
| 10 | ෂෙල් | එක්සත් ජනපදය | තෙල් හා ගෑස් | 386 |

ඉහත සංඛ්‍යා සියල්ල සැලකිල්ලට ගත්කල ලෝකයේ නිෂ්පාදනය සහ වෙළඳාම එක්සත් ජනපදය සහ චීනය අතර තරඟයක් බවට පත්ව ඇත.

## ක්‍රිකට් .......

තෝරා පත් කරගනු ලබයි. ආයතනයේ සභාපති, උප සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන ප්‍රධාන තනතුරු මෙම නිලවරණයේදී තෝරාගනු ලබයි. නමුත්, ක්‍රීඩා අමාත්‍යවරයාට ඇති බලය අනුව මෙම පාලක කමිටුව විසුරුවා හැරීමටත්, අතුරු පාලක කමිටුවක් පත්කිරීමටත් හැකියාව පවතී.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මඟින් අන්තර්ජාතික ක්‍රිකට් තරගාවලි මෙන්ම දේශීය ක්‍රිකට් තරගාවලි පැවැත්වීම හා පාලනය කිරීම සිදුකරනු ලබයි. ICC මඟින් සංවිධානය කරනු ලබන විදේශීය තරගමාලා සඳහා ජාතික ක්‍රිකට් කණ්ඩායම් සහභාගී කිරීමත්, දේශීය තරගමාලා සඳහා සංවිධාන කටයුතු සහ පහසුකම් සැලසීමත් මෙම ආයතනයේ වගකීමක් වේ. දැනට ශ්‍රී ලංකා ක්‍රිකට් මඟින් සංවිධානය කරන තරගාවලි වන්නේ 'ලංකා ප්‍රිමියර් ලීග්', 'ලංකා T10' (දින යෙදුවද තවම පවත්වා නැත.) සහ අන්තර් සමාජ තරගාවලිය. එමෙන්ම මේ යටතේ ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායම, ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම, පළමු පෙළ ක්‍රිකට් සහ ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායම පාලනය වේ.

### SLC වර්තමාන තත්ත්වය සහ ආදායම

2023 නොවැම්බර් 10 වන දින ICC විසින් SLCය "තම කටයුතු ස්වාධීනව කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව සහ පාලනය, නියාමනය සහ/හෝ පරිපාලනය තුළ රජයේ මැදිහත්වීමක් නොමැති බව සහතික කිරීම" අපොහොසත් වීම හේතුවෙන් අත්හිටුවන ලදී. ඉතාමත් ඛේදජනක ලෙස අනිසි දේශපාලන සහ පවුල් පාලන අත්පෙවීම් නිසා දිනෙන් දින ශ්‍රේණිගත කිරීම් සහ දස්කම් අතින් පහළටම යන ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම මේ වන විට තිලංග සුමතිපාල, ජයන්ත ධර්මදාස සහ රණතුංග පවුලේ දේපළක් බවට පත්ව ඇත. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය 2022 වර්ෂය තුළදී රුපියල් බිලියන 6.3ක් ලෙස සිය ඉහළම ශුද්ධ අදායම උපයා ඇත. මෙම වාර්තාව වසරින් වසර 3 ගුණයක වැඩිවීමක් සලකුණු කරන අතර, 2021දී උපයාගත් ශුද්ධ ලාභය බිලියන 2.1 කි.

### ICC සහ ඉන්දියානු ආධිපත්‍යය

බලය නිරන්තරයෙන් දුබලයා කෙරෙහි භාවිත වීම නොවැළැක්විය හැකි කාරණාවකි. ක්‍රීඩාවේදීද එය එලෙසෙම සිදු වන බව අපට දැකගැනීමට ප්‍රමාණවත් තරම් සාධක පවතී. ඉන්දියාව තමන් සතු දේශපාලනික මෙන්ම ආර්ථික බලය උපයෝගී කරගනිමින්, ශ්‍රී ලංකාව වැනි දුබල රාජ්‍යයන් මෙන්ම ICCයටද අත පෙවීම් සිදුකරයි. ICCය ඉන්දියාවට පක්ෂග්‍රාහී ලෙස කටයුතු කරන බවට ලෝකයේ බොහෝ දෙනා චෝදනා කරන අතරම එය විවිධ අවස්ථාවලදී ගනු ලබන තීන්දු තීරණවලදී මනාව පිළිබිඹු විය. එය තවත් තහවුරු කරන දෘශ්‍යමාන කාරණා වන්නේ ICC මූල්‍ය කමිටුවේ සභාපති වන්නේ ජේ ෂාය. එමෙන්ම පිරිමි ක්‍රිකට් කමිටුවේ සභාපති සව්රව් ගංගුලිය. විගණන කමිටුවේ සභාපති විජේ මල්හෝත්‍රාය. සරලවම මූල්‍ය කමිටුවේ සහ විගණන කමිටුවේ නායකත්වය එකම රටකට ලබාදීමම ගැටලුකාරීය. තවද ICC සිය ආදායම්-බෙදාහැරීමේ ආකෘතිය ප්‍රසිද්ධියට පත්කිරීම ප්‍රතික්ෂේප කරන අතර, නමුත්, ඉදිරි වසර සඳහා සිය ආදායම බෙදී යන ආකාරය ප්‍රකාශයට පත්කර ඇත. ඉන්දියාවට එහි වාණිජ ආදායමෙන් (අපේක්ෂිත ඇ.ඩොලර් මිලියන 600) 38.5% (ඩොලර් මිලියන 231) පමණ ලබා දීමට නියමිතය. එංගලන්තය 6.89% සහ ඕස්ට්‍රේලියාවට 6.25% ක් ද නවසීලන්තයට 4.73% සහ ඇෆ්ගනිස්තානයට 2.8 % ලැබෙනු ඇත. ඉතිරි 11.19% හෙවත් ඩොලර් මිලියන 67.19 පමණ සෙසු සාමාජික රටවල් 94 අතර බෙදාහරිනු ඇත. මෙම විෂමාකාර බෙදීයාමද ලෝකයේ දෝෂ දර්ශනයට ලක්වෙන තවත් එක් කාරණාවකි.

## විගණකාධිපති ඇසට .......

02 - පිටුවෙන්

ඇ.ඩොලර් මිලියන 8ක වන්දියක් ලබාගෙන තිබිණි.

උමා ඔය යටි ගං සංවර්ධන ව්‍යාපෘතිය (අලිකොටආර ගබඩා ජලාශය සහ කුඩා ඔය ගබඩා ජලාශය) සඳහා වෙන් කළ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 11,877ක් හෙවත් සියයට 120ක් වැයකර තිබුණ නමුත්, දකුණු ඉවුරු ඇළ යටතේ නිම කිරීමට අපේක්ෂිත කාර්යයන්ගෙන් සියයට 50කට වඩා වැඩි ප්‍රමාණයක් නිම කර නොතිබිණි. ඒ හේතුවෙන් උමා ඔය ද්‍රෝණියේ ජලය කිරිඳිඔය ද්‍රෝණියට හැරවීමේ ප්‍රධාන අරමුණවූ දකුණු පළාතේ පිහිටි ඉඩම් සඳහා ජලය සැපයීමට නොහැකිවී තිබිණි.

### මොරගහකන්ද අයථා ගෙවීම්

මොරගහකන්ද ජලාශයේ ප්‍රධාන බැම්ම ඉදිකිරීම මූලික ගිවිසුමේ විෂයපථය අනුව ඉදිකිරීමට යෝජිතව තිබූ මෙගාවොට් 5ක විදුලි ජනන යන්ත්‍ර 2ක් හා මෙගාවොට් 15ක විදුලි ජනන යන්ත්‍ර 1ක් සහිත විදුලි ජනන යන්ත්‍ර 3ක් මඟින් මෙගාවොට් 25ක් උත්පාදනය කරන විදුලි බලාගාරය වෙනුවට, මෙගාවොට් 5ක විදුලි ජනන යන්ත්‍ර 2ක් හා මෙගාවොට් 7.5ක විදුලි ජනන යන්ත්‍ර 2ක් සහිත විදුලි ජනන යන්ත්‍ර 4ක් මඟින් මෙගාවොට් 25ක් උත්පාදනය කරන විදුලි බලාගාරයක් ඉදිකිරීමට තීරණය කර තිබිණි. ඒ සඳහා අතිරේක ගාස්තු ලෙස ඇමෙරිකානු ඩොලර් 10,937,960ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම සඳහා අනුමැතිය ලබාදී තිබිණි. අතිරේකව දැරීමට සිදුවූ ඇමෙරිකානු ඩොලර් මිලියන 11ක වියදම රජයට සිදුවූ පාඩුවක්විය.

### යාන් ඔය වම් ඉවුරු ඇළ අයථා ගෙවීම්

යාන් ඔය වම් ඉවුරු ඇළ ඉදිකිරීම සම්බන්ධව චීන කොන්ත්‍රාත්කරු සමග එළැඹ තිබූ කොන්ත්‍රාත් ගිවිසුමට අදාළ සියලු වැඩ කොටස් ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් නිම කර ඇති බවට වූ කාර්යසාධන සහතිකය 2021 ඔක්තෝබර් 28 දින නිකුත් කර තිබුණද, ගිවිසුම් ප්‍රකාරව ඉටුකළ යුතුව තිබූ ඇමෙරිකානු ඩොලර් 3,478,910ක් වූ කාර්යයන් 6ක් ඉටුකර නොතිබුණි. ඒ පිළිබඳ නොසලකා සම්පූර්ණයෙන්ම වැඩ සහතික කර ගෙවා තිබිණි. - විගණකාධිපති වාර්ෂික වාර්තාව - 2022 (පිටු 94-96)

## යුද්ධය.....

08 - පිටුවෙන්

සිවිල් යුද්ධයේ (පන්ති ගැටුමෙහි) තියුණුකමෙහි අඩු-වැඩිකම් තීරණයවීම සිදුවෙයි.

### අධිරාජ්‍යවාදී යුද්ධය

ධනවාදය මේ මොහොතේ පවතින්නේ අධිරාජ්‍යවාදී අවධිය තුළය. එය ඒකාධිකාරී ධනවාදයයි. එහි මූලික ලක්ෂණ අතුරින් එකක් වන්නේ මූල්‍ය කතිපයාධිපත්‍යය නම්, ඒකාධිකාරී ස්වරූපය බිහිවීමය. මෙය කාර්මික ප්‍රාග්ධනයේ සහ බැංකු ප්‍රාග්ධනයේ ඒකාබද්ධතාවෙන් පැනනඟින්නකි. එතැන් පටන් ආර්ථික වශයෙන්ද, දෙවනුව භෞමික වශයෙන්ද බෙදා ගැනීමේ අවශ්‍යතාව පැනනඟී. එය තුළ කේන්ද්‍රයේ රටවල් විසින් පරිධියේ රටවල් මත තම ආර්ථික සහ දේශපාලන ආධිපත්‍යය පිහිටුවීම සඳහා ක්‍රියාමාර්ගයක් ලෙසින් යුද්ධය යොදා ගනු ලබයි. මෙම යුද ක්‍රියාදාමය හරහා රටවල් කැබැලි කොට දුර්වල කිරීම, ගැති පාලනයන් පිහිටුවීම සහ සෘජු ආක්‍රමණ හරහා යටත් කොට ගැනීම ආදිය සිදු කරනු ලබයි (ජාතිවාදී සහ ආගම්වාදී බොහෝ ගැටුම් පිටුපස අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණ පවතී).

තවද, මෙයට අමතරව අන්තර් අධිරාජ්‍ය ප්‍රතිවිරෝධය වර්ධනයවීම නිසාද යුද්ධ පැනනඟියි. පළමු සහ දෙවැනි ලෝක යුද්ධ ඇතිවන්නේ මෙම තත්ත්වය තුළයි.

මේ අනුව පැහැදිලි වන්නේ පන්ති රහිත සමාජයේ යුද්ධයෙහි සහ පන්ති සහිත සමාජයෙහි යුද්ධයෙහි අරමුණෙන්ම වෙනසක් ඇති බවයි. පන්ති සමාජයේ යුද්ධය සිවිල් යුද්ධය සහ අධිරාජ්‍යවාදී යුද්ධය යන ආකාර දෙකෙන්ම දක්නට ලැබේ. අධිරාජ්‍යවාදී යුද්ධය මූල්‍ය ප්‍රාග්ධනයේ අවශ්‍යතාව මත පැනනඟින ම්ලේච්ඡ සහ ව්‍යසනකාරී එකකි. එහෙත්, ජනතාව තුළින් අධිරාජ්‍යවාදී සහ ධනපති පන්ති පීඩනයට එරෙහිව පැනනඟින සිවිල් යුද්ධය සියලු යුද්ධ නිම කරන යුද්ධයකි. මෙම අවධිය තුළ සිවිල් යුද්ධය විසින් සමාජවාදී සමාජ විප්ලවයට මඟ විවර කරනු ලබයි. පන්ති රහිත කොමියුනිස්ට් සමාජයකදී මෙම මානව විරෝධී යුද්ධ නිම වනු ඇත. ඒ අනුව සමාජවාදය උදෙසා පැනනඟින සිවිල් යුද්ධය විසින් ඉටු කරනු ලබන්නේ සමාජයේ ප්‍රගතිශීලී කාර්යභාරයකි.

# යුද්ධය යනු....

**වත්මන් ලෝක දේශපාලන ගමන්මඟ තුළ 'යුද්ධය' යන්න මඟින් මුළුමහත් මිනිස් සංහතියම බරපතළ අනතුරකට ඇදදමා තිබේ. සමස්ත ලෝකය පුරාම ව්‍යාප්ත කරමින් පවතින මෙම යුද ක්‍රියාවලිය මඟින් සිදුවන මහා මිනිස් සංහාරය මෙන්ම සාගින්න, ආබාධිත බව, අවතැන්වීම්, මානසික පීඩාවන් මෙන්ම ආර්ථික අර්බුද වැනි බරපතළ සමාජමය ප්‍රශ්න ගණනාවක් ඇති කර තිබේ. යුද්ධය පවතින රටවලට පමණක් සීමා නොවී ඉන් පිටස්තර රටවලට වක්‍ර ආකාරයට හෝ මෙමඟින් විශාල බලපෑමක් සිදුවෙමින් තිබේ. යුක්‍රේන - රුසියා යුද්ධය මෙන්ම ඊශ්‍රායල - පලස්තීන යුද්ධයද ඒ සඳහා මෑතකාලීන නිදසුන්ය.**

**මානව සමාජයේ සංවර්ධනයට අනුරූපව යුද්ධයද විවිධාකාරයෙන් වර්ධනය වෙමින් පවතින බව ඒ ගැන අධ්‍යයනය කිරීමේදී පෙනී යයි. සමාජ පරිවර්තන ක්‍රියාවලියකට සක්‍රිය දායකත්වයක් සපයන දේශපාලන ව්‍යාපාරයක් ලෙස අපට යුද්ධය පිළිබඳ නිවැරැදි මාක්ස්-ලෙනින්වාදී කියැවීමක් අවශ්‍ය වන්නේ ඒ අනුවය. මෙම කෙටි ලිපිය ඒ සඳහා ප්‍රවේශයකි.**

## ප්‍රාථමික සාමූහික සමාජය සහ යුද්ධය

සමාජ සංවර්ධන ගමන්මඟ තුළ මිනිසා පසු කළ පළමු සමාජය වන්නේ ප්‍රාථමික සාමූහික සමාජයයි. පන්ති රහිත මෙම සමාජය තුළ ආයුධ සන්නද්ධ විශේෂ පිරිසක් හෙවත් සන්නද්ධ හමුදා හෝ පොලිසි හෝ පැවැතුණේ නැත. එම සමාජයේ යම් ගෝත්‍රයක සියල්ලෝම අවි දරන්නන් වූහ. ඒ එම ගෝත්‍රයේ පැවැත්ම උදෙසාය. ගෝත්‍රයට පිටතින් එන බලපෑමක්, තම භූමිය තුළට අනවසර පැමිණීමක් ආදී හේතු මත ඔවුන් විසින් අවි දරමින්, සමූහයක් ලෙස සටන් වැද අනෙකා පලවා හරින ලදී. යම් තත්ත්වයක් තුළ සටනේදී යටත් වූවන් ගෝත්‍රයට එක් කර ගන්නා ලදී. අන්‍යෝන්‍ය රැකවරණය පිළිබඳ රීතිය වූයේ 'ලේ පළිය ගැනීම' යන්නයි. එයින් අදහස් වන්නේ ගෝත්‍රයේ වංශයක යමකුට පිටතින් පහර දීමක් වන්නේ නම්, පහර කෑ අය වෙනුවෙන් පහර දුන් අයගෙන් (වංශයෙන්) පළිගැනීමට සමූහයේ අනෙක් සියල්ලන් බැඳී සිටි බවයි. ඉන් පුද්ගලයාද, වංශය අයත් ගෝත්‍රයද ආරක්ෂා වේ. මෙම සමාජ - ආර්ථික ක්‍රමය පෞද්ගලික දේපළ සහිත එකක් නොවන නිසාම සියලු රීති, අවි දැරීම් සාමූහික අර්ථයෙන් පැවැති ඒවා විය.

**"වංශයට අයත් සාමාජිකයෝ එකිනෙකාට ආධාර කිරීමටද, ආරක්ෂාව සලසා දීමටද, විශේෂයෙන් පිටස්තර උදවිය කරන පහර දීම්වලදී පළිගැනීමට උදවු දීමටද බැඳී සිටියහ. තම ආරක්ෂාව සඳහා පුද්ගලයකුට වංශයේ ආරක්ෂාව පැතිය හැකි විය. එසේම එය ඔහුට ලැබිණි.** එකකුට පහරක් ගැසීම මුළු වංශයටම ගැසූ පහරක් ලෙස සලකනු ලැබීය. මෙයින් එනම්, වංශයේ ලේ නෑකම් නිසා ඉරෝකුයිස්වරුන් කොන්දේසි විරහිතව පිළිගත් ලේවල පළිය ගැනීමේ අනිවාර්යය ඇතිවිය. වංශයෙන් පිට කෙනකු විසින් වංශයේ සාමාජිකයකු මරනු ලැබුවහොත්, මැරුම්කනු ලැබූ තැනැත්තා අයත් වංශය ලේවල පළිය ගැනීමට දිවුරුම් දෙයි. පළමුව වියවුල බේරීමට වංශය මැදිහත් වේ. මැරූ පුද්ගලයා අයත් වංශයේ මණ්ඩලය රැස්වී මැරුම්කනු ලැබූ පුද්ගලයාගේ වංශයේ මණ්ඩලය වෙත යෝජනා ඉදිරිපත් කරයි. සිදුවූ වැරැද්දට සමාව ඉල්ලා සිටීම සහ වටිනා තෑගිබෝග පිරිනැමීම මෙහි සිරිතය. මේ යෝජනා පිළිගත්තේ නම්, අවුල එතැනින් නිම වෙයි. එසේ නැතිනම්, මැරුම්කෑ පුද්ගලයාගේ වංශ මණ්ඩලය පළිගන්නකු හෝ පළිගන්නන් කීප දෙනකු හෝ පත්කරයි. ඔවුන්ගේ කාරිය මිනීමරුවා ලුහුබැඳ ඔහු මරා දැමීමය. මෙය සාර්ථක විණි නම්, පසුකී වංශයේ අයට දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට අයිතියක් නැත. එම කාරිය සමතයකට පත්වූ දෙයක් ලෙස සලකනු ඇත."

එංගල්ස් - පවුල පෞද්ගලික දේපල හා රජය ඇතිවූ සැටි - 89 පිටුව

## පන්ති සමාජය සහ යුද්ධය

පන්ති රහිත සමාජයේදී යුද්ධය පිළිබඳ පැවැති අරමුණු සහ ස්වරූපය පන්ති සමාජය බිහිවීමත් සමඟ වෙනස් විය. සැබැවින්ම වත්මන් ස්වරූපයේ යුද්ධ පැනනඟින්නේ පන්ති බිහිවීමත් සමඟය. එම නිසා යුද්ධය හා පන්ති අරගලය අතර සම්බන්ධතාවක් පවතී. මාක්ස්-ලෙනින්වාදයට අනුව සෑමවිමටම එය පන්ති අරගලයට යටත් කොට විග්‍රහ කරනු ලබන්නේ එබැවිනි. මෙම යුද්ධය යන්න සිවිල් යුද්ධය සහ අධිරාජ්‍යවාදීන්ගේ යුද්ධය යන දෙයාකාරයෙන් දක්නට ලැබෙයි.


## සිවිල් යුද්ධය

පන්ති සටනේ උච්චතම අවස්ථාවේ සිවිල් යුද්ධ පැනනඟින අතර, එය පන්ති අතර බලය හුවමාරු වන අවස්ථාව බවට පත්වේ. තවද, සිවිල් යුද්ධය දේශීය ධනපති පන්තිය එරෙහිව මෙන්ම අධිරාජ්‍යවාදයට එරෙහිවද යන දෙයාකාරයේ ඒකාබද්ධතාවක් ලෙස පැනනඟියි. ජාතික විමුක්ති අරගලයේදී මතුවන්නේ එවන් ආකාරයේ සිවිල් යුද්ධයයි.

**"සිවිල් යුද්ධය යනු පන්ති අරගලයේ ඉතාමත් තියුණු අරගල ආකෘතිය බවත්, පන්ති අතර ආර්ථික සහ දේශපාලන ඝට්ටන සහ සංග්‍රාම නැවත නැවතත් ඇතිවෙමින්, පුළුල් වෙමින්, තියුණු වෙමින් පන්ති අරගලය එක් පන්තියක් තවත් පන්තියකට විරුද්ධව ආයුධ සන්නද්ධව කරන අරගලයක් බවට පරිවර්තනය වන එම අවස්ථාව බවත්, සියලුම යුරෝපීය විප්ලවවල මෙන්ම මෙම විප්ලවයේ අත්දැකීම්වලින් පෙනේ. තරමක් දුරට හෝ නිදහස් සහ දියුණු රටවල් සියල්ලෙහිම බොහොමයක් අවස්ථාවල නිතරම පාහේ සිවිල් යුද්ධ ඇතිවන්නේ ධනපති ක්‍රමයේ මුළුමහත් ආර්ථික සංවර්ධනයම විසින් ලෝකය මුළුල්ලේම වන නවීන සමාජයේ මුළු ඉතිහාසයම විසින් නිර්මාණය කරනු ලබන්නාවූ සහ ගැඹුරු කරනු ලබන්නාවූ අන්‍යෝන්‍ය සතුරු තත්ත්වයක් දරන පන්ති අතරය. වෙනත් වචනවලින් කියතොත්, සිවිල් යුද්ධ ඇතිවන්නේ ධනපති පන්තිය සහ නිර්ධන පන්තිය අතරය."**

ලෙනින් - 05 වෙළුම 281 පිටුව

සිවිල් යුද්ධයද අන් සෑම එකක් මෙන්ම යුද්ධයකි. පන්ති අරගලය පිළිගන්නේ නම්, ඒ සමඟම සිවිල් යුද්ධයද පිළිග ැනීමට සිදුවෙයි. සෑම පන්ති සමාජයකම එය ඇතිවීම සාමාන්‍ය දෙයකි. මෙය පොදු තත්ත්වය වන අතර, නිර්ධන පන්ති ව්‍යාපාරයේ සංවිධාන ශක්තිය සහ පුළුල් බහුජන ව්‍යාපාරයක් ලෙස වර්ධනයවී ඇති ප්‍රමාණයට සාපේක්ෂව මෙම 07 පිටුවට



"ප්‍රහාරකයා කවුරුන්ද? නැතහොත්, සතුරා කඳවුරු බැඳගෙන සිටින්නේ කාගේ රටෙහිද යන්න අනුව යුද්ධයෙහි ස්වභාවය (එය ප්‍රතිගාමීද නැතහොත්, විප්ලවවාදීද යන්න) තීරණය වන්නේ නොවේ. එය තීරණය වන්නේ යුද්ධය කරන්නේ කුමන පන්තියද, යුද්ධයෙන් ඉදිරියට ගෙන යන්නේ කුමන දේශපාලනයක්ද යන්න අනුවය."

(9 වැනි වෙළුම, 74 වැනි පිටුව.